**තලාව ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 27 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව තලාව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) වටිනාකම එකතුව රු.1,601,322 ක්වූ යන්ත්‍රෝපකරණ, මෝටර්රථ හා කරත්ත සහ ලීබඩු හා උපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ). දේශීය ණය හා සංවර්ධන අරමුදලට 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු.4,126,958 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබුණු රු.79,720 ක්වූ ගොඩනැගිලි ද්‍රව්‍ය ඉතිරි තොග ලෙස නොපෙන්වා වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.2,185,364 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය තුලදී නිම කරන ලද කර්මාන්ත වෙනුවෙන් ලැබී තිබුණු රු.45,628,654 ක්වූ මුලධන ආධාර, ආදායම් වියදම් ගිණුම බැර කරනු වෙනුවට තැන්පත් ගිණුම බැර කර තිබුණි.

(ඊ). ක්ෂේත්‍ර ගබඩා වශයෙන් ගිණුම්වල දක්වා තිබුණු වටිනාකම රු.30,069 ක්වූ තොගය සහ ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා තිබුණු රු.25,000 ක වටිනාකමින් යුත් කඩ කාමරයක අයිතියද සභාව සතුව නොපැවතුණි.

1.3.2 **නොසැසඳු ගිණුම්**

-------------------

මූල්‍ය ප්‍රකාශන අනුව, වත්කම්/වගකීම් විෂයයන් 05 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.65,058,924 ක්වූ අතර උපයෝගී ලේඛන/වාර්තා අනුව එකී ගිණුම් ශේෂයයන්ගේ එකතුව රු.67,109,998 ක් වුයෙන් රු.2,051,074 ක වෙනසක් පැවතුණි. මෙම වෙනසට නිශ්චිත හේතුන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 84,732,350 ක්වූ වත්කම් විෂයයන් 05 ක් හා එකතුව රු.38,434,140 ක්වූ වගකීම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරිමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,052,494 ක්වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,437,178 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 99 විධිවිධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදී වවුචර් සහතික කිරීමෙන් තොරව අවස්ථා 117 කදී එකතුව රු.1,398,550 ක් ගෙවා තිබුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති අංක 180 ප්‍රකාරව මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් හෝ ආදායම් පිළිබඳ රාජකාරි ඉටු කරන නිලධාරීන් විසින් සභාපතිවරයා නියම කරන ලද ප්‍රමාණකින් ඇප තැන්පත් කර නොතිබුණි.

(ඇ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව රු.254,500 ක්වූ වර්ෂ 02 කට වැඩි කාලයක් ඉක්මවූ හිමිකම් නොපෑ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | ---------------- | ------------ | ------ | -------- |
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් හා බදු | 7,374 | 9,446 | 9,182 |
| (ii). | බදු කුලී | 15,231 | 6,707 | 2,270 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 1,274 | 1,545 | 182 |
| (iv). | වෙනත් ආදායම් | 10,203 | 16,827 | 3,751 |

**2.3.2 වරිපනම් හා බදු**

**--------------------**

2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ වරිපනම් බදු රු.9,182,346 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදුකුලී**

---------

2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කඩකුලී රු.2,270,045 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

-------------------

සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු 26 ක් වෙනුවෙන් අයවිය යුතු රු.66,257 ක මුදල අය කරගෙන නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ ආදායම 3,312,645 ක්වූ අතර 2008 සිට 2012 වර්ෂය දක්වා

කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම නිශ්චය කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි.

**2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

සභාව සතුව පවතින පහත සඳහන් වත්කම් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රීයව තිබුණි.

| වත්කම | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| මෝටර්රථ හා කරත්ත | 02 | 800,555 |
| ඉඩම් හා ගොඩනැගිලි | 02 | 1,457,642 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | - | 411,000 |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව වසරකට එකතුව රු.1,000 ඉක්මවා දරනු ලබන පොදු වැදගත්කමකින් යුත් උත්සව පැවැත්වීම හෝ ආගමික පූජා, සංස්කෘතික, සෞඛ්‍ය විනෝදාත්මක හෝ අධ්‍යාපනික කාර්යයන් සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යාවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් අවස්ථා 5 කදී එලෙස දරනු ලැබූ එකතුව රු.305,000 ක්වූ වියදම් සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**2.6 මෙහෙයුම් අකාර්ක්ෂමතා**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ

(අ) සභාව සතු පැරණි වෙළඳ පොළ කඩ කාමර කුලියට දීමේ ගිවිසුම් නියමිත දින වලට අලුත් නොකිරීම හේතුවෙන් රු.25,000 ක් වටිනාකම වූ කඩ කාමරයක අයිතිය සභාවට අහිමි වී තිබුණි.

---

(ආ). පළාත් පාලන කොමසාරිස්ගේ 1989 දෙසැම්බර් 30 දිනැති අංක එල්ජී/3 දරන චක්‍රලේඛයේ vii ඡේදයේ විධිවිධාන වලට පටහැනිව වෙළඳ අයිතිය බදු දෙන ස්ථානවල අවම ලංසුවට වඩා අඩුවෙන් බදු දීම හේතුවෙන් රු.42,644 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ). ඍජු ශ්‍රම කර්මාන්ත සඳහා මිලදී ගෙන ඉතිරි වූ රු.358,555 ක් වටිනා සිමෙන්ති තොගයක් ප්‍රයෝජනයට නොගෙන කල් ඉකුත් වී තිබුණි.

(ඇ). සේවය අත්හැර ගිය හා මියගිය සේවකයන් 03 දෙනෙකුගෙන් වසර තුනකට වඩා පැරණි අයවිය යුතු රු.66,211 ක ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ආදායම් පරිපාලනය
(ආ). වත්කම් කළමනාකරණය.
(ඇ). ණයගැති හා ණයහිමි පාලනය.